# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2244/3 - 2021 සැප්තැම්බර් මස 06 වැනි සඳුදා - 2021.09.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික ප්‍රතිපත්ති හා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, "වෝටර්ප්‍රොන්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන ආයතනය සම්බන්ධයෙන් පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ 2018 අගෝස්තු මස 14 දිනැති අංක 2084/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත, පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ 2014 ජනවාරි මස 30 දිනැති අංක 1847/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයට තවදුරටත් වූ වශයෙන් මෙම නියමය මගින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කරමි, එනම් -

පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ 2018 අගෝස්තු මස 14 දිනැති අංක 2084/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පශ්චාත් නියමය මගින් සංශෝධිත, 2014 ජනවාරි මස 30 දිනැති අංක 1847/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ (4) වන වගන්තිය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාල සීමාව 2021 ඔක්තෝබර් මස 12 වැනි දින සිට ආරම්භව තව දුරටත් වූ මාස දාහතරයි (14) දින විස්සක් වූ (20) කාලසීමාවක් සඳහා දීර්ඝ කිරීමේ අරමුණින් යුතුව පහත දක්වෙන ආකාරයට කියවෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ ඃ

"(4) බස්නාහිර පළාතේ, කොළඹ 02, ග්ලැනී වීදිය යන ස්ථානයේ දී අදියර දෙකකින් යුතුව ("ඒකාබද්ධ නිවාඩු නිකේතනය" යනුවෙන් හඳුන්වනු ලබන) සුඛෝපභෝගී හෝටලයක්, සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් ආශ්‍රිත පහසුකම් සහිත විනෝද කටයුතු, ජාත්‍යන්තර ප්‍රමිතියේ සාප්පු සංකීර්ණයක්, සුඛෝපභෝගී සහාධිපත්‍ය දේපළ, සේවා මහල් නිවාස සහ කාර්යාල අවකාශයක් ඇතුළු සුඛෝපභෝගී බහුවිධ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම, ඉදිකිරීම, සකස් කොට සම්පාදනය කිරීම, උපයෝගීතාවයට පැවරීම, හිමිකාරත්වය දැරීම, කළමනාකරණය කිරීම, මෙහෙයවීම, විකිණීම, බදුදීම සහ කුලියට ලබාදීම සඳහා වූ ව්‍යාපෘතියක් පිහිටුවීම පිණිස වූ ඉහත කී ව්‍යාපෘතිය, 2022 දෙසැම්බර් මස 31 වැනි දින වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලැබිය යුතු ය."

**මහින්ද රාජපක්ෂ**, පා.ම.
ආර්ථික ප්‍රතිපත්ති හා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 06 වැනි දින,
ආර්ථික ප්‍රතිපත්ති හා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ දී ය.


1A - PG 5419 — 545 (2021/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*